# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1859/14 - 2014 අප්‍රේල් මස 23 වැනි බදාදා - 2014.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ මාතර ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම**

මිය යාම හේතු කොට ගෙන මාතර ප්‍රාදේශීය සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

වසන්ත වීරසිංහ චන්ද්‍රසිරි නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ මාතර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන රන්උලුගේ යෝගානන්ද සොයිසා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මාතර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී වේවැල්වල හේවගේ රවින්ද්‍ර විජය කුමාර වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, රන්උලුගේ යෝගානන්ද සොයිසා මහතා මාතර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩබ්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරී,
මාතර ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 22 වන දින,
මැතිවරණ කාර්යාලය,
මාතර.

05 - 135


1A - G 19425— 95 (2014/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

### කළුතර ප්‍රාදේශීය සභාව

කළුතර ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන සෙම්බප්පෙරුම ආරච්චිගේ දොන් නිලන්ත මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව කළුතර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
කළුතර ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 03 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
කළුතර.

05 - 136

---

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

### හොරණ ප්‍රාදේශීය සභාව

හොරණ ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන නම්බිගේ රොහාන් පිරිස් මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව හොරණ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
හොරණ ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 03 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
කළුතර.

05 - 137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.